බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරී / සහකාර බන්ධනාගාර අධිකාරී (පුනරුත්ථාපන) නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 (2021)

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සහකාර බන්ධනාගාර අධිකාරීවරුන්ට අදාළ බඳවා ගැනීම් පරිපාටිය අනුව, සහකාර බන්ධනාගාර අධිකාරීවරුන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2021 ජූනි මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හා ගණකාධිකාරී සේවයේ, පළාත් පාලන සේවයේ හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාළ විභාගය සඳහා සහකාර අධිකාරීවරුන් පෙනී සිටිය යුතු වේ. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන ඩී8/21/90/බ.පරි/සහකාර අධිකාරී හා 2006/01/17 දිනැති බඳවා ගැනීම් පරිපාටියෙහි දැක්වෙන අතර අයදුම්කරුවන්ගේ පහසුව සඳහා විභාග පරිපාටිය (වගුව 01) හා විෂය නිර්දේශය (වගුව 02) පහත දක්වා ඇත.

(අ) (වගුව 01) - විභාග පරිපාටිය.

| විෂය අංකය | විෂයය | කාලය (පැය) | මුළු ලකුණු | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු |
|---|---|---|---|---|
| 01. | නීතිය I | 03 | 100 | 40% |
| 02. | නීතිය II | 03 | 100 | 40% |
| 03. | ගිණුම් ක්‍රම | 03 | 100 | 40% |
| 04. | නුහුරු භාෂාව<br>i. ලිඛිත | 02 | 100 | එක් එක් විෂයය සඳහා 35% |
| | ii. වාචික | - | 100 | |
| 05 | පරිපාලන විෂයය | 03 | 100 | 40% |

(ආ) (වගුව 02 ) - විෂය නිර්දේශය.

| විෂය අංකය | විෂයය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01. | නීතිය I | i. සාක්ෂි ආඥා පනත<br>ii. අපරාධ දණ්ඩ නීති සංග්‍රහය |
| 02. | නීතිය II | i. බන්ධනාගාර ආඥා පනත සහ බන්ධනාගාර නීතිය.<br>ii. තරුණ වරදකරුවන්ගේ විශෝධන විද්‍යාල ආඥා පනත.<br>iii. පරිවාස ආඥා පනත |
| 03. | ගිණුම් ක්‍රම | මුදල් රෙගුලාසි සහ මූල්‍ය ක්‍රම ඇසුරින් ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ඇත. |
| 04. | නුහුරු භාෂාව | i. සිංහල මාධ්‍යයෙන් සහ දෙමළ මාධ්‍යයෙන් සේවයට බැඳී ඇති නිලධාරීන් සඳහා නුහුරු භාෂාව විෂයයට පැවැත්වෙන ලිඛිත සහ වාචික පරීක්ෂණ සඳහා පෙනී සිට පරීක්ෂණ දෙකෙන්ම සමත් විය යුතුය.<br>ii. සිංහල මාධ්‍යයෙන් සේවයට ඇතුළත්ව ඇති නිලධාරීන් දෙමළ විෂයය සඳහාද දෙමළ මාධ්‍යයෙන් සේවයට ඇතුළත්ව ඇති නිලධාරීන් සිංහල විෂය සඳහාද විභාගයට පෙනී සිටිය යුතු ය.<br>iii. සාමර්ථ්‍යයක් ලබා ගැනීම සඳහා ලිඛිත සහ වාචික යන එක් එක් කොටස සඳහා ලකුණු 35%ක් ලබා ගත යුතු ය.<br>iv. සිංහල මාධ්‍යයෙන් සේවයට බැඳුනු නිලධාරීන් අ.පො.ස.(සා/පෙළ) විභාගයේදී දෙමළ විභාගය සඳහා ද දෙමළ මාධ්‍යයෙන් බැඳුනු නිලධාරීන් එම විභාගයේදී සිංහල විෂයය් සඳහා ද සම්මාන සාමර්ථ්‍යය සහිතව සමත්ව ඇත්නම් කඩඉම් පරීක්ෂණයේ නුහුරු භාෂා විෂයය ද නිදහස් කරනු ලැබේ. |

